උඩුනුවර ප්‍රාදේශීය සභාව - **2020**

-------------------------------------------

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 අහිතකර මතය

උඩුනුවර ප්‍රාදේශීය සභාවේ 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් වියදම් ගිණුම, වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 172(1) උපවගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මාගේ වාර්තාවේ අහිතකර මතය සඳහා පදනම කොටසේ සාකච්ඡා කර ඇති කරුණුවල වැදගත් බව හේතුවෙන්, 2020 දෙසැම්බර් 31 දිනට උඩුනුවර ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු නොකරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 අහිතකර මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු නොකරන බව මා දරන්නා වූ මතය වේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන්, ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ප්‍රාදේශීය සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

## 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇති වන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබා දීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේ දී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව, විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේ දී, වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසු බවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේ දී ,වංචා හෝ වැරදි හේතුවෙන්, මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති වීමේ අවදානම් හඳුනා ගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදු වන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදු වන බලපෑමට වඩා වංචාවකින් සිදු වන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟ හැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුව ද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය ගිණුම්කරණ, ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ ප්‍රාදේශීය සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකි වන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ව්ධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලැසුම් කර තිබේ ද, යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වා ගෙන යනු ලැබේ ද යන බව;

- අදාළ ලිඛිත නීතියකට හෝ ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ප්‍රාදේශීය සභාව ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,
- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාල සීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත් වේ .

(අ) 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6(1)(ඈ)(iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව, ප්‍රාදේශීය සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමග අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6(1)(ඈ)(iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව, මෙම වාර්තාවේ 1.6.1 ඡේදයේ (අ) නිරීක්ෂණ හැර, ඉකුත් වර්ෂයේ දී, මා විසින් සිදු කරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මාගේ වාර්තාවෙන් පෙන්වා දුන් 1.3.1 (අ) හා (ආ) දරන ගිණුම්කරණ අඩුපාඩු නිවැරදි කිරීමට කටයුතු කර නොතිබුණි. | ඉදිරියේ දී නිවැරදි කිරීමට කටයුතු කරමි. | ගිණුම්කරණ අඩුපාඩු නිවැරදි කළ යුතු වීම |
| (ආ) | සභාව සතු වටිනාකම රු.6,221,373 ක් වූ Compactor රථයේ වටිනාකම ගිණුම්ගත කර නොතිබුණි. | 2021 වර්ෂයේ ගිණුම්ගත කිරීමට කටයුතු කරමි. | නිවැරදිව ගිණුම් තැබිය යුතු වීම |
| (ඇ) | සමාලෝචිත වර්ෂයේ සහනාධාර වියදම රු.147,500 ක් අඩුවෙන් ගිණුම්ගත කර තිබුණි. | ජ'නල් සටහන් මඟින් ඉදිරියේ දී නිවැරදි කිරීමට කටයුතු කරමි. | නිවැරදිව ගිණුම් තැබිය යුතු වීම |
| (ඈ) | ස්ථාන මාරු වී පැමිණි නිලධාරින්ගේ නොගෙවූ රු.1,688,739 ක් වූ ණය ශේෂයක් සමුච්චිත අරමුදලට බැර කර තිබුණි. | ඉදිරියේ දී නිවැරදි කිරීමට කටයුතු කරමි. | නිවැරදිව ගිණුම් තැබිය යුතු වීම |
| (ඉ) | සමාලෝචිත වර්ෂයේ රු.4,609,375 ක් වූ ගෙවිය යුතු ණයහිමි ශේෂ 19 ක් ගිණුම්ගත කර නොතිබුණි. | ඉදිරියේ දී නිවැරදි කිරීමට කටයුතු කරමි. | නිවැරදිව ගිණුම් තැබිය යුතු වීම |

| | | | |
|---|---|---|---|
| (ඊ) | ඉකුත් හා සමාලෝචිත වර්ෂයේ දී, අවිනිශ්චිත ගිණුමේ ශේෂය නිවැරදි කිරීම සඳහා යොදන ලද රු.38,464,780 ක වටිනාකමට අදාළ වූ ජ'නල් සටහන් 05 ක් සඳහා වූ පැහැදිලි කිරීම් විගණනයට පිළිගත නොහැකි බැවින්, අවසන් ශේෂය නිවැරදි නොවන බව නිරීක්ෂණය විය. | 2021 වර්ෂයේ ගිණුම සකස් කරන විට වැරදි නිවැරදි කරමි. | අවිනිශ්චිත ගිණුම් නිවැරදි කළ යුතු වීම |

**1.6.2 නොසැසඳු පාලන ගිණුම් හෝ වාර්තා**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ගිණුම් ශේෂ 07 කට අදාළව ගිණුම් අනුව ශේෂය හා උපලේඛන අනුව ශේෂය අතර රු.2,300,047 ක නොසැසඳීමක් විය. | වරිපනම් ශේෂය පළාත් පාලන කොමසාරිස්ගේ උපදෙස් මත නිවැරදි කරන බව හා අනෙක් උපලේඛන නිවැරදි කරමි. | උපලේඛන නිවැරදිව පිළියෙල කළ යුතු වීම |

**1.6.3 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| එකතුව රු.4,650,856 ක් වූ ගිණුම් විෂයයන් 02 කට අදාළ වත්කම් ලේඛන, තක්සේරු වාර්තා හා උපලේඛන විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. | 2018 වර්ෂයට පෙර සිට පැවත එන ලේඛන වන අතර, නිවැරදි කිරීමට කටයුතු කරමි. | විගණනයට අවශ්‍ය සාක්ෂි සැපයිය යුතු වීම |

**2. මූල්‍ය සමාලෝචනය**

**2.1 මූල්‍ය ප්‍රතිඵල**

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.21,313,313 ක් වූ අතර, ඊට ප්‍රතිරූපිව ඉකුත් වර්ෂයේ ආදායම ඉක්මවූ පුනරාවර්තන වියදම රු.8,766,539 ක් විය. මේ සඳහා පුනරාවර්තන වියදම් අඩුවීම හා සේවා ගාස්තු ආදායම වැඩිවීම හේතු වී තිබුණි.

## 2.2 ආදායම් පරිපාලනය

### 2.2.1 ආදායම් රැස් කිරීමේ කාර්යසාධනය

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | **වරිපනම්** | | |
| | 2011 වර්ෂයේ සිට 2015 වර්ෂය දක්වා කාල පරිච්ඡේදය තුළ වරිපනම් ආදායම් එකතු කිරීමේ දී, සිදුව තිබූ මූල්‍ය අක්‍රමිකතාවයන් අනාවරණය වීමත්, එකී මූල්‍ය අක්‍රමිකතාවයට අදාළව තවමත් ක්ෂේත්‍රය තුළින් කරුණු හෙළිදරව් වෙමින් පවතින බව ආදායම් පරීක්ෂකවරු ප්‍රකාශ කිරීම සහ මූලික හා අවසන් පරීක්ෂාවන් තුළින් රු.1,028,451 ක වරිපනම් හිඟ ශේෂයක් අය කර ගත යුතු වරිපනම් වංචා ගිණුම ලෙස සමාලෝචිත වර්ෂයේ අවසාන දිනට මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබීමත්, පසුගිය වර්ෂයේ දී පැවති මෙම ශේෂය නිරවුල් නොවීමත් යන හේතූන් මත සමාලෝචිත වර්ෂයේ අවසාන දිනට මූල්‍ය ප්‍රකාශනවල දක්වා ඇති රු.28,298,081 ක හිඟ හිටි වරිපනම් ශේෂයේ නිවැරදිතාවය පිළිබඳ විගණනයේ දී සෑහීමකට පත් විය නොහැකි විය. | නිවැරදි කිරීමට අවශ්‍ය කටයුතු සිදු කරමි. | නිවැරදි කිරීමට කටයුතු කළ යුතු වීම |
| (ආ) | **උසාවි දඩ හා මුද්දර ගාස්තු** | | |
| | පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරින්ගෙන් 2020 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතුව තිබූ උසාවි දඩ රු.25,357,540 ක් හා මුද්දර ගාස්තු රු.31,824,458 ක් අය කර නොතිබුණි. | ඉදිරියේ දි අය කිරීමට කටයුතු කරමි. | ලැබිය යුතු ආදායම් අය කළ යුතු වීම |
| (ඇ) | **කඩ කුලී** | | |
| i. | කඩ කාමර බදු ගත් බදුකරුවන් තිදෙනෙකු ඒවා අතුරු බදු දී තිබිය දී, නව වෙළඳ සංකීර්ණයේ කඩ කාමර 03 ක් නැවත ලබා දීම සඳහා ගිවිසුම් අත්සන් කර තිබුණි. | කඩ කාමර ලබා දීමේ දී මෙම පුද්ගලයාට අවස්ථාවක් නොදෙමි. | කඩ කාමර බදු දීම නිවැරදි ක්‍රියාවලියක් මත සිදු කළ යුතු වීම |
| ii. | ගෙලිඔය බස් නැවතුම්පොළ අසළ පිහිටි වළං අළෙවි කිරීම සඳහා පවත්වා ගෙන යන කඩ කාමරය සඳහා 2014 වර්ෂයෙන් පසු නව තක්සේරුවක් ලබා ගැනීමට හා රු.99,650 ක් වූ හිඟ කුලි අය කර නොතිබුණි. | ගැටළුවක් පැවති අතර, එය නිරාකරණය කර, හිඟ අය කිරීමට කටයුතු කරමි. | හිඟ මුදල් අය කළ යුතු වීම |

## 2.3 අධිභාර

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| ප්‍රාදේශීය සභා පනතේ විධිවිධාන ප්‍රකාරව වගකිව යුතු අයවලුන්ට එරෙහිව මවිසින් සමාලෝචිත වර්ෂය තුළ දී, රු.1,160,960 ක වටිනාකමට වූ අධිභාර 02 ක් පනවා තිබුණි. ඉකුත් වර්ෂයන් තුළ පැන වූ අධිභාර සමඟ 2020 දෙසැම්බර් 31 දිනට රු.1,085,285 ක මුදලක් අය කර නොතිබුණි. | අය කර ගැනීම සඳහා අදාළ පාර්ශව වෙත ලිපි යවා ඇති බව දන්වමි. | අධිභාර අය කළ යුතු වීම |

## 3. මෙහෙයුම් සමාලෝචනය

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගිතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුඛ විහරණය, පහසුව හා සුභසාධනය යන සභාව විසින් ඉටු කළයුතුව තිබුණු කර්තව්‍යයන් ඉටු කිරීම පිළිබඳව නිරීක්ෂණය වූ කරුණු පහත දැක්වේ.

## 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| වසර 05 ක කාලයක් ඉක්මවා තිබූ එකතුව රු.11,177,694 ක වරිපනම් හා හිඟ කඩ කුලී අය කර නොතිබුණු අතර, වසර 01 සිට 05 අතර කාල පරාසයක් ගත වී ඇති එකතුව රු.6,968,123 ක කර්මාන්ත හා පොදු සැපයුම් ණයහිමි ශේෂ නිරවුල් කර නොතිබුණි. | අදාළ පාර්ශව වෙත දැනුම් දී ඇති අතර, ඉදිරියේ දි නඩු පවරා අය කිරීමට හා ගෙවීම් නිරවුල් කිරීමට කටයුතු කරන බව දන්වමි. | ලැබිය යුතු ශේෂ අය කළ යුතු වීම හා ගෙවීම් නිරවුල් කළ යුතු වීම |